**පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 492**

**ආයතනයේ නම : වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය**

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

# පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 492

## වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය

**පළමු කොටස : 94.00**

| | කමිටුව විසින් හඳුනාගත් අඩුපාඩු | එම අඩුපාඩු නිවැරදි කිරීමට ආයතනය ගෙන ඇති පියවර / වර්තමාන තත්ත්වය |
|---|---|---|
| 01. | සියලු වාහනවල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැත. | අමාත්‍යාංශය විසින් භාවිතා කරනු ලබන සියළුම වාහනවල ලියාපදිංචි සහතික මෙම අමාත්‍යාංශය සතුව පවතී. වෙනත් අමාත්‍යාංශ / ආයතන නමින් ලියාපදිංචි කර ඇති මෙම අමාත්‍යාංශය විසින් භාවිතා කරනු ලබන වාහන 16 ක අයිතිය පවරා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. |
| 02. | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | සංචිත වාහන සඳහා වන දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා මේ වනවිට විධිමත් පරිදි විගණකාධිපති වෙත යොමු කරනු ලබයි. |
| 03. | සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි. | අංක 26/92 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි පෞද්ගලික ගමන් සඳහා නිල වාහනය භාවිතා කිරීමට අවසර හිමි නිලධාරීන් වෙත අනුයුක්ත කර ඇති වාහන හැර, අනෙකුත් වාහන සඳහා නියමිත පරිදි රාජ්‍ය ලාංඡනය හා අමාත්‍යාංශ නාමය පිටතට පැහැදිලිව පෙනෙන පරිදි ප්‍රදර්ශනය කිරීමට කටයුතු කර ඇත. නිලධාරියෙකු වෙත අනුයුක්ත කර ඇති වාහනයක් යම් අලුත්වැඩියාවක් සඳහා යොමු කරන අවස්ථාවලදී ඒ වෙනුවට සංචිත වාහනයක් අවශ්‍ය පරිදි වෙන් කළ යුතුවේ. එබැවින් සියළුම වාහන සඳහා රාජ්‍ය ලාංඡනය පින්තාරු කිරීම ගැටලුකාරී වී ඇත. සංචිත වාහනවල රාජ්‍ය ලාංඡනය ප්‍රදර්ශනය කිරීමට අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරනු ලැබේ. |
| 04. | වාහනයක් ගර්හිත වී මාස 08 වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි. | 2024 හා 2025 වර්ෂයන් තුළ වාහන 11 ක ප්‍රමාණයක් අපහරණය කර ඇත. අමාත්‍යාංශය සතු වාහන ගර්හිත තත්ත්වයේ නොමැති නමුත් ඒ ඒ කාල සීමාවන් තුළ අමාත්‍යාංශයේ විෂය පථයට ඇතුළත් වන ආයතන සතු වාහන අපහරණය කිරීමට සිදුවේ. එවැනි වාහන අපහරණය කිරීමේදී නීතිමය ගැටළු ඇතිවන අවස්ථාවන් වලදී නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් ලබාගැනීමට සිදුවන බැවින්, එවැනි අවස්ථා |

| | | |
|---|---|---|
| | | වලදී මාස 08 කට වඩා අඩු කාලයක් තුළ ගර්හිත වාහනයක් අපහරණය කිරීමට නොහැකි වන අවස්ථා මතුවී ඇත. ඉදිරියේදී මෙම කටයුතු අදාළ කාලය තුළ සිදු කිරීමට කටයුතු කරමි. |
| 05. | මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී මාසයක් ඇතුළත නිරවුල් කර නොතිබුණි. | මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කරන තත්කාර්ය අතුරු අග්‍රිම කාර්යය නිමවී දින 10 ක් ඇතුළත නිරවුල් කිරීමට මේ වනවිට කටයුතු කරනු ලබයි. |

**දෙවැනි කොටස : 94.00**

| | කමිටුව විසින් හඳුනාගත් අඩුපාඩු | එම අඩුපාඩු නිවැරදි කිරීමට ආයතනය ගෙන ඇති පියවර / වර්තමාන තත්ත්වය |
|---|---|---|
| 01. | සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි. | රාජ්‍ය සේවයේ සියළුම මාණ්ඩලික හා මාණ්ඩලික නොවන නිලධාරීන්ගේ කාර්ය සාධන ඇගයීම් සම්බන්ධව පිළිවෙලින් 1998/03/13, 1998/04/30 හා 1998/12/11 දිනැතිව නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/98, 08/98 (i) හා 08/98 (ii) මඟින් කාර්යය සාධන ඇගයීම් සඳහා හඳුන්වා දී ඇති ආකෘති පත්‍ර පරිදි නිලධාරීන් වෙතින් කාර්යය සාධන ඇගයීම් වාර්තා ලබා ගැනීමට අඛණ්ඩව කටයුතු කරන ලදී. එම කාර්යය සාධන වාර්තා ආශ්‍රිතව නිලධාරීන්ගේ පුහුණු අවශ්‍යතා හඳුනාගෙන එම අවශ්‍යතා සපුරාලීමට අදාළ ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. කෙසේවුව ද 2023.11.30 දිනැති රා.ප.ච.02/2018 (i) මඟින් වාර්ෂික කාර්යය සාධන ගිවිසුම් අත්සන් කිරීම තවදුරටත් අවශ්‍ය නොවන බව දන්වා ඇත. |

**ගුණදාස සමරසිංහ**
**ලේකම්**

සකස් කළේ :- පී.කේ.ජේ.කේ.රත්නසිරි

පරීක්ෂා කළේ :- ප්‍රධාන ගණකාධිකාරී I

නිර්දේශ කළේ :- ප්‍රධාන මූල්‍ය නිලධාරී